# පෘතුගීසි හා ලන්දේසි පාලන සමයේ පහතරට ප්‍රදේශවල බෞද්ධාගමික ප්‍රබෝධය

ශාස්ත්‍රපති අජිත් තල්වත්ත

පෘතුගීසි සහ ලන්දෙසි පාලන අවධිය මෙරට ඉතිහාසයේ තීරණාත්මක අවධීන් දෙකක් ලෙස හඳුනාගත හැකිය. ඔවුන් මෙරටට පැමිණ සමාජ දේශපාලන සහ ආර්ථික ක්ෂේත්‍රය කෙරෙහි දක්වා ඇති බලපෑම ඉතිහාසය දෙස බැලීමෙන් පැහැදිලි වේ.පහතරට කේන්ද්‍රකරගනිමින් ඔවුන් බලය ගොඩ නැගීමේ දී එවකට ප්‍රධාන ආගමික සංස්ථාව වූ බෞද්ධාගම ඇතුළුව සෙසු දේශීය ආගම් වෙත එල්ල වූ පීඩනය වඩාත් වැඩිවිය. එහි ප්‍රතිඵලයන් ලෙස බෞද්ධාගමට එල්ල වූ අභියෝග ජය ගනිමින් පෘතුගිසි අවධියේ සිට ලන්දේසි යුගයේ අවසානය දක්වා පහතරට ප්‍රදේශවල ඇති වූ බෞද්ධාගමික ප්‍රබෝධය අධ්‍යනය කිරීමට මෙයින් අදහස්කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ පහතරට පළාත්වල පෘතුගිසි සහ ලන්දෙසී යුග අවධිවල බුද්ධාගම දේශීය භාෂා සාහිත්‍ය සහ සංස්කෘතිය අරබයා ඇතිවන සාකච්ඡාවේදී එම ප්‍රදේශවල පැවති තත්ත්වය අන්ධකාර යුගයන් සේ සැලකිමට බොහෝ දෙනා පුරුදු වී ඇත. චූලවංශ රචනා කළ සුමංගල හිමියන්ගේ විස්තරයෙන් ද විදේශීය ලේඛනවල අන්තර්ගත රචනාවල ඇතුළත් බෞද්ධ විරෝධී ප්‍රකාශන සහ ප්‍රතිකාල් ක්‍රියා සාධාරණ කිරීම හා එයින් ගම්‍ය සෘජු බලපෑම් ද මුං කොටුවේ රාළ ඇතුළුව වැලිවිට සරණංකර හිමියන්ගේ ශාසනික සේවාව අගය කළ රචනා ද උඩරට කතෝලික ආගම ව්‍යාප්ත කරමින් දේශීය ආගම් හෙලා දුටු ඔරෙටෙරියන් නිකායික ගොන්සලවේස්ගේ රචනා මඟින් මේ අවධියේ පීඩනය හමුවේ වර්ධනය වූ බෞද්ධාගමික ප්‍රබෝධය ගැන ලබාදෙන කථිකාවත එතරම් පැහැදිලි නැති බව පෙනේ.

ක්‍රි.ව. 1505 දී පෘතුගීසි ආගමනයෙන් සමඟ භික්ෂුව රාජාණ්ඩුව සහ ජනතාව අතර පැවති සබධතාවය ක්‍රමයෙන් දෙදරා යන ලකුණු පහළ වන්නට විය. රට අභ්‍යන්තරයෙහි දේශපාලන ස්ථාවරභාවයක් නොවුනු අතර කෝට්ටේ රජු ලංකාවේ අග රජු හැටියට සම්මත වූ නමුත් ප්‍රාදේශීය රජුන් සහ අගරජු තුළ ස්ථිර සම්බන්ධතාවයක් හෝ සමඟියක් නොවීය. මේ රජුන් අතර නිරන්තර කළ කෝළහාල ඇතිවිය. එබැවින් රටේ අභිවෘදියට කළ හැකි සේවාව බොහෝ දුරට අඩපන විය. ආර්ථික තත්ත්වයේ ඇති වූ පසුගාමිත්වයත් සමඟ ශාස්ත්‍රීය කටයුතු

අතින් සහ ශාස්ත්‍රීය කටයුතු පමණක් නොව බුද්ධාගමේ සහ භික්ෂූන්ගේ තත්ත්වය දුර්වල වන්නට විය.

රටේ පැවති අස්ථාවර තත්ත්වයත් පාලකයින්ගේ දුර්වලකම් නිසා පෘතුගීසින්ට මෙරටේ පරිපාලන කටයුතු වලට අතපෙවීමට අවස්ථාව උදා වීමත් නිසා දිනෙන් දින පහතරට කේන්ද්‍ර කරගනිමින් බුදු සසුන හුදකලා වන්නට විය. පෘතුගීසීන්ගේ එක් අරමුණක් වූයේ ක්‍රිස්තියානි ආගමට මෙරට ව්‍යාප්ත කිරීමයි. කොළඹ, පානදුර, මක්ගොන, බේරුවල, ගාල්ල, වැලිගම ආදී මුහුදුබඩ පළාත්වල සමඟ පෘතුගීසින් සමඟ පැමිණි රෝමානු කතෝලිකයන්ගේ බලය පැතිරීමත් බුදු සසුනට ක්‍රමයෙන් පීඩනය වර්ධනය විය. ආගම ව්‍යාප්ත කිරීම දෙවියන් වහන්සේ වෙනුවෙන් යුතුකම් ඉටුකිරීම සේ සැලකිය. ස්වකීය ආගම ව්‍යාප්ත කරන ගමන් දේශීය ආගම් විනාශ කිරීම ව්‍යාපාරයක ද යෙදුණු පෘතුගීසීහු බෞද්ධ වෙහෙර විහාර විනාශකාර බෞද්ධ භික්ෂූන් වහන්සේලාට තාඩන පීඩන කරමින් මහත් භීෂණකාරී වාතාවරණයක් පහතරට කෙන්ද්‍රකරගනිමින් නිර්මාණය කළහ.

හත්වන බුවනෙක බාහු (1521-1551) රජතුමා ක්‍රිස්තියානි පූජකවරුන්ගෙන් සිදුවූ බලපෑම නිසා කෝට්ටේ රාජ්‍යට ක්‍රිස්තියානි පූජකයන්ට ප්‍රියමනාප වූ උරුමකරුවෙකු බලයට පත්කිරීමට ඔවුහු උත්සාහ ගත්හ. පසුව ධර්මපාල භෞතීස්ම කිරීමට ද පූජකවරු නොබෝ කලකින් සමත් විය. මේ අනුව අභිෂේකය ලද රජතුමා බෞද්ධාගමේ ආරක්ෂකයා හා ප්‍රධාන අනුග්‍රහකයා යන තත්ත්වයෙන් ඉවත් වී කතෝලික ආගම පෝෂණය කර අවසානයේ කෝට්ටේ රජකම පවා පෘතුගාලයේ රජුට තෑගි ඔප්පුවකින් පවරනු ලැබීය. ධර්මපාල භෞතීස්ම වීමත් සමඟ සිදුවූයේ එතෙක් බෞද්ධ විහාරාම සතු වූ ඉඩකඩම් ධන ධාන්‍ය ආදිය ක්‍රිස්තු ධර්මයේ ව්‍යාප්තිය සඳහා පූජකයින් වෙත පැවරීමය. ඒ සමඟම මෙතෙක් සිංහල, ජනතාවගේ නොමද ගෞරවාදයට පත් වූ දළදා මාළිගාව ශාන්ත ෂෙව්යර මුනිතුමාගේ පල්ලිය බවට පත්විය. පහතරට සුවිසල් විහාරාරාම හා බුදු පිළිම කඩා බිඳ දමා කතෝලික පල්ලි බවට පූජකයන් විසින් පරිවර්ථනය කළහ. කැළණිය වැනි අතිසෙයින් පූජනීය ස්ථාන විනාශ කොට දමා ඒවා සතු දේපළ ප්‍රැන්සිස්කානු පූජකයන්ට පවරා ඇත. වත්තල සිරිසඟබෝ පිරිවෙණ, පැපිලියානේ සුනේත්‍රාදේවි පිරිවෙණ, තොටගමුවේ විජයබා පිරිවෙණ ඇතුළු මහා පිරිවෙණ් විනාශ කළහ. විහාරාමවල තිබූ වස්තුව කොල්ලකෑමෙහි යෙදුනු සොල්දාදුවෝ කතෝලික පූජකවරුන්ගේ උසිගැන්වීම් නිසා වෙරළබඩ පිහිටා තිබූ

විහාර දේපළ විනාශ කළහ. කැළණි රජමහා විහාරය, මුල්කිරිගල කොතිදගල, කතගල, ගෝකතන්නගිරි විහාරය, නාගදීප විහාරය ආදී ඒවා එම අවධියේ විනාශකර ලද විහාරස්ථාන අතර ප්‍රධාන විය.

මේ ආකාරයට පහතරට කේන්ද්‍ර කරගනිමින් බුදුසසුනට නොයෙක් කෙනෙහෙලිකම් සිදු වෙද්දී අසරණ වූ භික්ෂූන් වහන්සේලාට සීතාවක රාජධානිය තුළ ආරක්ෂාව සැපයින. මායාදුන්නේ යටතේ බුදුදහමට රැකවරණය ලැබුන ද බුදුදහම හැරදමා හින්දු ආගම වැලඳගත් පීතෘඝාතක පළමු රාජසිංහ රජුගේ කාලයේදී දරුණු සැහැසිකම් නිසා බුද්ධාගමටත් භික්ෂූන්ටත් බරපතල හානි සිදුවිය. රාජසිංහ රජුට එරෙහිව කුමන්ත්‍රණය කළ භික්ෂූන් වහන්සේලා චෝදනා විභාගයකින් වැරදිකරුවන් වූ විට සීතාවක ගඟේ කතාමැදිරියන් වලේ ගිල්වා මරවා ඒ භික්ෂූන් වහන්සේලාගේ පන්සල් හා දේපොළ පෙරුමාල් ප්‍රමුඛ ඉන්දියානු තාන්ත්‍රියානික බ්‍රාහ්මණ පූජකයන්ට පවරා දී ඇත. මෙසේ රජු බොහෝ භික්ෂූන් මරවා ආගමික වූ ද ශාස්ත්‍රීය වූද පොත්පත් රාශියක් පුළුස්සා දැමීය. කෝට්ටේ ප්‍රදේශයේ බෞද්ධ කටයුතු අඩාලවීමත් භික්ෂූන් වහන්සේලා විශාල පිරිසක් උපවැදි වීමත් නිසා සංඝ ශාසනය තුළ උපසම්පදා කර්මය නොපැවැත්විය.

සීතාවක රාජසිංහ මිය යෑමත් සමඟ සීතාවක රාජ්‍යයේ ඇති වූ බල අරගලය ප්‍රයෝජනයට ගත් ප්‍රතිකාලුන් ධර්මපාලගේ නාමයෙන් කෝට්ටේ රාජ්‍යය ඈදා ගැනීමට ක්‍රියා කළහ. මේනිසා බෞද්ධයන්ට පහතරට ප්‍රදේශවල ආරක්ෂාවක් නොවීය. මෙම අවධියවන විය මහනුවර රාජධානියේ වැදගත්කම ඉස්මතු වූ අතර පළමුවෙනි විමළධර්මසූරිය බලයට පත්වීමෙන් සමඟ සිංහල ජාතියේත් බෞද්ධාගමේත් ආරක්ෂකයා විය. මෙයින් පසු සීතාවකින් අවතැන් වූ භික්ෂූන් වහන්සේලා කන්ද උඩරට බල ප්‍රදේශය තුළ ඒකරාශී විය. රාජාණ්ඩුව, සිංහල ජනසමාජය සංඝයා වහන්සේලා අතර පැවති සම්බන්ධතාවය මෙසේ පසුබෑමකට ලක් වුවද උඩරට රාජ්‍ය ප්‍රමුඛවීමත් සමඟ යළි ගොඩනැගෙන්නට විය. ප්‍රතිකාලුන් විසින් පහතරට ප්‍රදේශයේ විනාශ කළ බෞද්ධ ආයතන යළි ගොඩනගන්නට විය.

එනමුත් පහතරට ප්‍රතිකාල් බලය ස්ථාවරවීමත් සමඟ භික්ෂූන්වහන්සේලාට සිවුරු දරා ආගමික කටයුතුවල යෙදීම තහනම් කෙරෙණි. ප්‍රැන්සිස්කන් පූජකවරු ප්‍රතිකාල් හමුදා ආධාරයෙන් බෞද්ධ ආරාම විනාශ කළා පමණක් නොව භික්ෂූන් වහන්සේලාද ඝාතනය

කළහ. මේනිසා වත් පිළිවෙත් රැකීමට භික්ෂූන්ට නොහැකි විය. උඩරටට සාපේක්ෂව පහතරට ප්‍රදේශවල කතෝලික මිෂනාරින් සමඟ බෞද්ධයින් සිය ආගමික අනන්‍යතාවය පවත්වාගෙන යාමට ගත් උත්සාහයේදී උඩරට රජතුමාගේ ලැබුණු පිටුවහල ඉතා වැදගත් විය.

පෘතුගීසි අවධිය තුළ මෙසේ පහතරට ප්‍රදේශයේ වර්ධනය වූ කතෝලික බලය හමුවේ බෞද්ධාගමට එල්ල වූ පීඩනය වඩාත් වැඩි වුයේ ලන්දේසි පාලනය ඇරඹීමත් සමඟය. ඔවුන්ගේ ආගමික ප්‍රතිපත්තිය 1642 බතාවියානු ව්‍යවස්ථාව මගින් පාලනය වූ අතර ඔවුන්ගේ බල ප්‍රදේශය තුළ අන්‍ය ආගම් ඇදහීම සහ ප්‍රචාරය කිරීම නීතිය මඟින් තහනම්කර තිබිණ. විශේෂයෙන්ම 1657 සැප්තැම්බර් පැනවූ ප්ලැකොට් අඥාව මගින් කිසිවෙකුට සබත් දින හා ක්‍රිස්තියානි ආගමික උත්සව දිනවල කායික වැඩපොලවල යෙදීම, කර්මාන්තවල යෙදීම තහනම්කර එය උල්ලංඝනය කරන්නන්ට එරෙහිව දඩ ගැසීම හෝ බන්ධනාගාර ගත කිරීම සිදුකර ඇත. මෙය බෞද්ධ ජීවන ක්‍රමයට එල්ල කරන ලද පහරක් විය. එතනින් නොනැවතී 1678, 1682, 1699, 1709, 1711 යන වර්ෂවල නිකුත් කළ ආඥා මගින් බෞද්ධාගම් මර්දනයට තව තවත් නීති පනවනු ලැබීය. මීට අමතරව 1732 නිකුත් කළ නිනයෝගයක් මගින් කැල්වින්වාදී නොවන ආගමික පුද පූජාවල යෙදෙන්නන්ට රික්ස් ඩොලර් 200 ක දඩයක් නියම කළේය. ප්‍රසිද්ධියේ කස පහර තැලීමටද දම්වැල්වලින් බැඳ අවුරුදු 25ක කාලයක් සමාගමේ වැඩ කිරීමට ද නියම විය. එපමණක් නොව මෙරට මුලාදැනින් මාස දෙකක් ඇතුළත තම බල ප්‍රදේශවල ඇති බෞද්ධ විහාරාරාම විනාශ කිරීමට ද එසේ නොකරන අයට තදබල දඬුවම් පමුණුවා කේප් කොළණියට පිටුවහල් කරන බවට ද නියෝග නිකුත්කර තිබේ. ඔවුන්ගේ බලය පැවැති පහතරට ප්‍රදේශවල බෞද්ධ භික්ෂූන්ට ජීවත්වීමට හා ආගමික කටයුතු වල නිරතවීමට ඉඩ නොදිය යුතු බව පෙන්වා බෞද්ධාගමික වත් පිළිවෙත් වලටදැඩි සේ නීති පනවා ඇත. එමගින් පහතරට ප්‍රදේශයේ බෞද්ධ ජන ජීවිතයට දැඩි පීඩාකාරීභාවයක් දිනෙන් දින වර්ධනය වන්නට විය.

මේ අනුව පැහැදිලි වන්නේ පෘතුගීසි හා ලන්දේසී අවධිවල මෙරට බෞද්ධාගමටත් බෞද්ධ සමාජයටත් දැඩි පීඩාකාරිභාවයක් ස්මතු වන්නට විය. එම පීඩනය කේන්ද්‍රකරගනිමින් සියවස් තුනකට ආසන්න කාලයක් තුළ පහතරට ප්‍රදේශයේ ක්‍රියාත්මක වූ බෞද්ධාගමික ප්‍රබෝධය පිළිබඳව මීළඟට විමසා බැලිය යුතු වේ.

අප ඉහතින් පෙන්වාදුන් තත්ත්වය යටතේ ප්‍රසිද්ධියේ බෞද්ධාගමික කටයුතු යෙදීම බෙහෙවින් අන්තරාදායික විය. පන්සල හෝ භික්ෂුව නැතිව බෞද්ධයකු වශයෙන් ජීවත්වීමට හැකි වුවද පන්සල හා භික්ෂුව වටා කාලයක් සමඟ වර්ධනය වී ඇතුළත් වූ බෞද්ධ චාරිත්‍ර හා උත්සව කටයුතු භික්ෂුවගේ සහයෝගයෙන් ක්‍රියාත්මක විය. විදේශීය ජාතියත්, විදේශීය ආගමත් දේශීය හවුල්කරුවන් මාර්ගයෙන් බලහත්කාරයෙන් පවත්වාගෙන ජීවත්වීමට අවශ්‍ය ආරක්ෂාව පොදු ජන සමාජයෙන් ලැබිණ. එවෙනි අවිහිංසාවාදී ක්‍රියාමාර්ග සමාජය තුළ ක්‍රියාත්මක කිරීම එතරම් පහසු නොවීය. සුළු කාලයක් තුළ ලංකාවේ විශාල ප්‍රදේශයක් පුරා ඇති වූ ශාසන විලෝපනය තුළ භික්ෂුවගේ තත්ත්වය කනගාටුදායක ලෙස පිරිහිණි. උඩරටින් බෞද්ධාගමේ අභිවෘද්ධියට පිටුවහල ලැබුණද පහතරට පැවති තත්ත්වය ඉතාමත් සෝචනීය විය. 1597 පළමු විමලධර්මසූරිය රජතුමා රක්ඛංගදේශයෙන් උපසම්පදාව ගෙන්වා මෙරට ඇති කිරීමට උත්සහ ගත්තද ප්‍රමාණවත් භික්ෂූන් සොයාගැනීම පහසු නොවීය. මේ සමඟම උඩරට බෞද්ධාගමික වර්ධනය ඇති වී ඊට සමගාමීව පහතරට ප්‍රදේශයේ බෞද්ධාගමික කටයුතු තරමක් දුරට ස්මතු වුවද ප්‍රතිකාල් බලය හමුවේ වඩාත් කාර්යක්‍ෂමව ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. එනමුත් රජුගෙන් ලැබුණු පිටුවහල නිසා තම ආගම ව්‍යාප්ත කිරීමට බෞද්ධයන්ට හැකි විය. දෙවන රාජසිංහ රජතුමා (1635-1687) කන්ද උඩරට සිහසුන දැරූ ප්‍රබල රජතුමා විය. ඔහු විසින් ප්‍රතිකාල් සමඟ ඇතිකරගෙන තිබූ ආරවුල් නිසා නිතර පහතරට ප්‍රදේශවල යුධකාරී වාතාවරණයක් තිබුණි. පෘතුගීසීන් හා ලන්දේසීන් පාලන බලය භුක්ති විඳිමින් ක්‍රියාකරනු දුටු හෙතෙම ඔවුන්ගේ කටයුතු වෙරළබඩ තීරයට පමණක් සීමා කිරීමට ද දැඩි උත්සාහයක් ගත්තේය. මේ තත්ත්වය තුළ සියවසකට ආසන්න කාලයක් සංඝ සංවිධානය ක්‍රමවත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය රාජකීය අවධානය යොමු කිරීමට උඩරට රජවරු අසමත් වූහ. භික්ෂු අධ්‍යාපනය සංවිධානය දුර්වල වී භික්ෂු අධ්‍යාපනය අඩපන විය. භික්ෂූන් අතර ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරාව ක්‍රමය වෙනුවට දේපළ හිමිකම් බඳුවර්ග සහ සිවුරු පාරම්පරා ක්‍රමය ලියන්නට විය. ඒ තුළින් පැරණි සිංහල, පාලි, සංස්කෘත අධ්‍යනය පසුගාමී තත්ත්වයක් කරා වර්ධනය වන්නට විය.

ඕලන්ද බල අධිකාරිය ප්‍රබලවත්ම පහතරට ප්‍රදේශවල කතෝලික පූජකවරුන්ට ඒ ප්‍රදේශයේ සැරි සැරීමට හෝ ආගමික කටයුතුවල යෙදීම ඕලන්ද කැල්වින්වාදී පූජකවරුන් ඉඩ නොදුන්හ. මේනිසා කතෝලික පූජකවරු උඩරට රජුගේ ආගමික සහනශීලිත්වය යටතේ උඩරට කේන්ද්‍රකරගනිමින් සිට රැකවරණය ලබා හෝ රහසේ මුහුදුබඩ පළාත්වල

ආගමික කටයුතු වල නිරත වූ අතර ඒ සමඟම බෞද්ධ විරෝධී ව්‍යාපාරවල නිරතවීමට පසුබට නොවීය. තම දිවිය පරදුවට තබා කතෝලික ආගම ව්‍යාප්ත කළ පූජකයන් ලෙස ජෝෂප්වාස් පියතුමා සහ ජාකොබ් ගොන්සල්වේස් පියතුමා පෙන්වා දිය හැකිය.

අඩ සියවසක් පමණ කාලය තුළ පහතරට ප්‍රදේශයේ පැවති ප්‍රතිකාල් බලය හමුවේ බෞද්ධයෝ බෞද්ධ වත් පිළිවෙත් අඛණ්ඩව පවත්වාගෙන යාමට ගෙනගිය ක්‍රියාදාමයෙහි නොමසුරුව සහාය ලැබුණේ ගණනින්නාන්සේලාගෙනි. උපසම්පදා භික්ෂූන් නාමක හෝ ඊට වැඩි පරිසකට සංඝ ගණ යන නම භාවිත විය. ගණ හා සංඝ යන වචන දෙකෙහි අදහස වූයේ සමූහ යන්නයි. මහනුවර අවධිය වනවිට ගණනින්නාන්සේ යනුවෙන් තනි පුද්ගලයකු හැඳින්වීම පිණිස යෙදු නාමයක් ලෙස සිංහල ශබ්ද කෝෂයෙහි පෙන්වා දී ඇත. උපසම්පන්න භික්ෂූන් නැති වූ පසු ඉතිරිව සිටි මහණ පැවිද්දන් හට කියූ නම ගණනින්නාන්සේ බව සෝරත හිමියෝ පවසති. රොබට් නොක්ස්ගේ විස්තරයට අනුව ගණින්නාන්සේ ලෙස දකින්නේ තෙරුවන්වහන්සේලාගෙන් පිටස්තර වූ භික්ෂුවට ඒ නම භාවිතා වූ බවයි.

ගණනින්වහන්සේලාට තම කටයුතු පවත්වා ගෙන යාමට සිදු වූයේ හොඳින් දන්නා ප්‍රදේශවල සහ බෞද්ධ වත් පිළිවෙත් අගය කළ සමාජයක් තුළදීය. ඔවුන්ට ආරක්ෂාවීමට සිදු වූයේ ලන්දේසි නිළධාරීන් පූජකයන් සහ ඕලන්ද ජාතිකයන්ට හිතවත්කම් දැක් වූ මුලාදෑනින් ගෙන්ය. ඔවුන්ට උඩරට රජතුමාගෙන් ද පසු අවධිය වනවිට නොමඳ අනුග්‍රහය ලැබිණ. විනාශ මුඛයට ගිය පන්සල් ආශ්‍රිතව ගණනින්නාන්සේලා ඉටු කළ මෙහෙවර ඉතා වැදගත් වේ. මෙම අවධියේ ඔවුන් සිංහල, පාලි, සංස්කෘත දැනුම අඛණ්ඩව ආරක්ෂාකර ගැනීමට සමත් විය. තමන් දන්නා ශිල්ප ශාස්ත්‍ර හැකි පමණින් සිය දරු මුණුබුරන්ට උගන්වමින් ආගමික අතින් ඔවුහු විශ්ව කෝෂයන් බඳු විය. ඒ වගේම ඕලන්ද බලය හමුවේ ගණින්නාන්සේලා මාතර, හම්බන්තොට ප්‍රදේශවල සිට පැල්මඩුල්ල, රත්නපුර හරහා උඩරට සමඟ සම්බන්ධතා පවත්වා සිය කටයුතු හොර රහසේ සිදුකර තිබේ.

ගණින්නාන්සේලාට අමතරව මෙම අවධියේදී පීඩනයට එරෙහිව බෞද්ධාගමික කටයුතුවල නිරත වූ තවත් පිරිස් කිහිපයක් හඳුනාගත හැකිය. පැරණි ශාස්ත්‍රීය දැනුම ඉදිරියට ගෙනයමින් ගුරුවරු වෙදමහත්වරු වැනි අයගේ ක්‍රියාකාරීත්වය ඉතා වැදගත් විය. මොවුන්ගේ

සේවා අවශ්‍යතාවය ප්‍රබල වත්ම ඔවුන්ගෙන් ඉටු වූ මෙහෙවර ඉතා වැදගත් විය. ගණින්වහන්සේලාගේ ආරක්ෂා කිරීමට දේශීය මුලාදෑණි පන්තිය වගේම පැරණි ශාස්ත්‍රීය දැනුම ආරක්ෂා කිරීමට දේශීය මුලාදෑණි පන්තිය විසින් ඉටුකර ඇති මෙහෙවර ඉතා වැදගත් වේ.

ඔවුන් ක්‍රිස්තියානි ආගම වැලඳ ගත්තද බෞද්ධ ජීවන ක්‍රමය අත් නොහළේය. සාහිත්‍ය කටයුතුවල නිරත වෙන අතර ඇතැම් අය සාහිත්‍යධරයන්ට උපකාර කරණු ලැබීය. මේ අනුව අපට පැහැදිලිවන්නේ මෙම අවධිය වන විට භික්ෂූන් වහන්සේලා ඉටු කළ මෙහෙවර කිහපයක් ගිහියන් අතට පත් වූ බවයි. ශාසනික කටයුතුවලට මුල් වූ ගණින්වහන්සේලා පීඩනය ප්‍රබල වද්දී ආගමික කටයුතු වල යෙදුනද ඒ තුළින් පහතරට ජන සමාජයට කළ බලපෑම ඉතා වැදගත් වේ. ශාස්ත්‍රීය කටයුතු ගිහියන්ට පැවැරුණු අවධියේ අලගියවන්න මුකවෙට්ටි ක්‍රිස්තියානි ආගම වැලඳගත්ත ද ඔහු විසින් දහම්සොඩ, බුදුගුණ අලංකාරය, දුස්සීලවත, සුභාෂිතය ඒ වගේම කුලසේකර අප්පුහාමි විසින් මණ්ඩොර ජාතකය රචනාකර සමාජයට ලබාදුන් පණිවිඩය ඉතා වැදගත්වේ.

ක්‍රිස්තියානින් විසින් විනාශ කළ ආගමික ස්ථානවලට රැස් වූ බෞද්ධයන් හා ගණින්වහන්සේලා පොහොය දි මුල්කරගෙන විශාල වශයෙන් උත්සව පවත්වා තිබේ. මෙහිදී ක්‍රිස්තියානි ආගම වැලදගෙන සිටි මුලෑදැනින්ගේ ලද පිටුවහල ද ඉතා වැදගත් විය. මෙසේ පැවැත් වූ ආගමික උත්සව කාඩාකප්පල් කිරීමට ක්‍රිස්තියානි පූජකයන් ක්‍රියා කළ විට අණ, විණ, සූනියම් වැනි කටයුතු නිරත වූවන්ගේ බලපෑම් නිසා මිෂනාරීන් මහත් අපහසුතාවයට පත් වූ බව පෙනේ.

ක්‍රිස්තියානින් මේ පළාත්වල ගොඩනැගූ අධ්‍යාපන ක්‍රමය මඟින් විශාල බලපෑමක් බෞද්ධ සමාජයට එල්ල කිරීමට සමත් විය. ක්‍රිස්තියානි ආගම වැළඳගැනීමට හා පල්ලියට සහභාගීවීම අනිවාර්ය කිරීමට ඔවුන් විසින් දැඩි නීතිරීති පනවා ඇත. සබත් දින, ක්‍රිස්තියානි ආගමේ සුවිශේෂි දින රජයේ නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශ කර බෞද්ධයන්ගේ පොහාය දිනයත් අහොසි කරනු ලැබීය. විවාහය පවා කේන්ද්‍ර කරගනිමින් ගොඩනැගූ ආධිපත්‍ය තුළ මෙරට සමාජයට එල්ල වූ පීඩනය ඉතා දැඩි විය. පිරිසක් බෞද්ධාගම අතහැර ක්‍රිස්තියානියට යන ලදි. එහෙත් පීඩනය හමුවේ ආගම වැලදගත්ත ද රහසිගතව බෞද්ධ වත්පිළිවෙත් රැකීමට ඇතමුන් අමතක නොකළහ.

මෙසේ පැවති පීඩනය හමුවේ පහතරට ජනතාව උඩරට රජතුමා වෙත ඇදී එන්නට විය. ඊට සමගාමීව උඩරට භික්ෂූන් වහන්සේලා සහ පහතරට ගණින්නාන්සේලා අතර සමීප සම්බන්ධතාවයක් වර්ධනය වන්නට විය. උඩරට රාජ්‍ය නිදහස් රාජ්‍යයක් වශයෙන් පැවතීමත් රජු බෞද්ධාගමේ ආරක්ෂකයා ලෙස පෙණී සිටීමත් නිසා පහතරට ප්‍රදේශවල බෞද්ධාගමික කටයුතු යළි ඉස්මතු වන්නට විය. මේ තත්ත්වය තුළ ක්‍රිස්තියානි පූජකවරු පවා රට අභ්‍යන්තරය වන්නට බෞද්ධ කටයුතු වලට එතරම් දුරට බාධා නොකළ බව පෙනේ. විශේෂයෙන්ම දෙවන රාජසිංහගේ මරණයෙන් අනතුරුව දෙවන විමලධර්මසූරිය රජතුමාගේ අභිෂේකයත් සමඟ පහතරට සහ උඩරට අතර සුහදශීලි සම්බන්ධතාවන් වර්ධනය වන්නට විය. එයට හේතු වූයේ උඩරට ප්‍රදේශයේ කුරුඳු ලන්දේසින්ට ලබා ගැනීමට හැකි වූ නිසා උඩරට සමග මිත්‍ර සම්බන්ධතා ඇතිකරගෙන ඇත. එය තුළින් උඩරට රජු අපේක්ෂා කළේ පහතරට වාසින්ට නිදහසේ අගාම ඇදහීමට ඉඩ සැලසීම සහ විනාශ කළ බෞද්ධ, හින්දු මධ්‍යස්ථානය නැවත පිළිසකර කිරීමය.

විශේෂයෙන්ම 1707 ශ්‍රී වීරපරක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමාගේ අභිෂේකයත් සමඟ එතෙක් පැවති සම්ප්‍රදායන් බිඳ දමා ඉන්දියානු කුමාරිකාවන් බිසවුන් බවට පත්කිරීමත් සමඟ හින්දු සහ ක්‍රිස්තියානි බලපෑම උඩරට සමාජය හිස ඔසවන්නට විය. රජු භික්ෂූන් කෙරෙහි එතරම් විශ්වාසයක් නොකළ හෙයින් ක්‍රිස්තියානින් රජුට සමීප විය. එයින් භික්ෂු ශාසනය ක්‍රමයෙන් පසුගාමී තත්ත්වයට පත් විය. මෙම අවධියේ උඩරට භික්ෂූන් ගැන ජාකොබ් ගොන්සාලෙස් විසන් 'උඩරට භික්ෂුව' ගැන කරන විග්‍රහය මෙසේය. එනම් 'මේ රටේ බුදුන්ගේ නම මිසක් ආගම පැවතීමේ කිසිවක් නැතිව බුදුන්ට මල් පමණක් දී යකුන්ට ගස් ගෙඩි ආදී සියලු වස්තුව තහනම්කර දෙන හෙයින් යක්ෂ ඇදහිල්ල විනා බුදුන්ගේ ඇදහිල්ල නැතැයි යතුවෙන්' දැන්වීමෙන් මෙම අවධියේ උඩරට භික්ෂුව සංවිධානයේ පැවති පසුගාමිත්වය හඳුනාගත හැකිය. ඒ වගේම ඔහු පහතරට විශේෂයෙන්ම මාතර ප්‍රදේශයේ පිරිස් බුදුන්ගේ ආගම අදහන හොඳම පරිස් ලෙස පෙන්වා දී ඇත. ඒ තුළින් බෞද්ධ වත් පිළිවෙත් පීඩනය හමුවේ වුවද රැකීමට සමත් වූ පරිස් පහතරට සිටි බව පෙන්.

ප්‍රතිකාල් හා ඕලන්ද පාලකයින් මිෂනාරින්ගේ උපදෙස් මත ක්‍රියාත්මක කළ බෞද්ධ විරෝධී ප්‍රතිපත්තිය නිසා පහතරට ගණින්නාන්සේලාට මුල් අවධියේ උඩරට රාජධානියට සමීප කරුඳු වැවෙන ප්‍රදේශවලින් ඈත්ව පිහිටි ප්‍රදේශයන් මුල් කරගනය.

විශේෂයෙන්ම හම්බන්තොට දිස්ත්‍රික්කය ඒ අතර ප්‍රධාන විය. මුල්කිරිගල, කතරගම, තිස්සමහාරාමය, බදගිරිය, කොටවාය, කහගල, අමංගල, වෙහැල්ල වැනි ආරක්ෂා සහිත වූත් පහසුවෙන් පුනරුත්ථාපනය කළ හැකි වෙහෙර විහාර ආශ්‍රිතව ඔවුහු තම කටයුතු ගෙනගියහ. තොටගමු පුරාණ විහාරය කැළණිය රජමහා විහාරය වැලිගල්ල අග්‍රබෝධි විහාරය යලි පිළිසකර කරවා බෞද්ධාගමික ප්‍රබෝධය ඇතිකිරීමට ගණින්නාන්සේලා පියවර ගෙන තිබේ. මොවුන් පාරිශුද්ධ ජීවිත ගතකර බෞද්ධ වත් පළිවෙත් කාර්යක්ෂමව ආරක්ෂා කිරීමට ක්‍රියා කරණු ලැබීය.

මේ අනුව පැහැදිලි වන්නේ උඩරට සහ ලන්දේසීන් අතර සමීප සම්බන්ධතාවය වර්ධනය වීමත් සමඟ ගණින්නාන්සේලාගේ ක්‍රියාකාරිත්වය වඩා කාර්‍යක්ෂම වීම නිසා මුහුදුබඩ පළාත්වල බෞද්ධාගමික පිළිවෙත් ශක්තිමත් වී 17 සියවස අවසාන වන විට ඕලන්ද බෞද්ධ විරෝධී ප්‍රතිපත්තියේ සසලවීමක් ඇති විය. මීට පෙර ලන්දේසීන් තම ප්‍රදේශවල කැල්වින්වාදී ආගමික කටයුතු පමණක් පවත්වාගෙන ගොස් බහුතර පිරිසක් ඇදහු බෞද්ධාගම ඇදහීමට ඉඩ නොදී බෞද්ධ වෙහෙර විහාර විනාශකර ඇත. එනමුත් උඩරට සමඟ යහපත් සම්බන්ධතාවයක් පැවැත්වීමේ ඇමුණින් උඩරට රාජයට ආසන්න පළාත්වල පන්සල් සෑදීමට විරුද්ධ නොවී වෙරළබඩ පළාත්වල එවෙනි දෑ කිරීමට ඉඩ නොදී ඇත. එහෙත් කුරුඳුවල අවශ්‍යතාවය නිසා අකමැත්තෙන් වුව ද බෞද්ධාගමට අනුග්‍රහය දැක්වීමට ලන්දේසීන් හට සිදු විය.

විශේෂයෙන්ම කැළණි විහාරය ආශ්‍රිතව වර්ධනය වූ බෞද්ධාගමික ප්‍රබෝධය නිසා ගණින්නාන්සේලා ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටුකර ඇත. 1688 වෙසක් දිනයේ උත්සව මාලාවක් සංවිධානය කළ අතර උඩරට භික්ෂූන් වහන්සේලා ද වැඩමවා ඇත. ක්‍රිස්තියානි රජයක් බලයේ පවතින පහතරට පළාත්වල මිථ්‍යා දෘෂ්ටික උත්සවයක් පැවැත්වීම පිළිබඳව මිෂනාරි බලවත් සේ උරන වී ආණ්ඩුකාර තුමාගේ මාර්ගයෙන් උත්සවය කඩා කප්පල් කිරීමටත් නැවත කැළණි විහාරය විනාශ කිරීමටත් පියවර ගෙන ඇත. මේ පිළිබඳව අවධානය යොමු කළ උඩරට රජතුමා පහතරට ප්‍රදේශවල බෞද්ධයින්ට නිදහසේ ආගම ඇදහීමට අවසර ලබාදෙන මෙන් ලන්දෙසීන්ගෙන් ඉල්ලා ඇත. ඉන් අනතුරුව 1699 නැවත ගණින්නාන්සේලා එකතු වී කැළණි වෙහෙර පුනුරුථාපනය කර උඩරටින් වැඩම කළ භික්ෂූන් ඇතුළුව 300 කගේ සහභාගිත්වයෙන් පහන් දහසක පූජාවක් පවත්වා තිබේ. උඩරට භික්ෂූන්

පෙරහරින් සියනෑකෝරළය හරහා වැඩම කර ඇත. මේ අනුව ප්‍රතිකාල් පාලන සමයේ බැතිමතුන්ගේ බැහැරව විනාශ වූ කැළණි විහාරය නැවත බෞද්ධයන්ගේ ගෞරවාදරයට පත්වන තැනක් බවට පත්විය. කැළණි විහාරයේ අයිතිය පිළිබඳ නොයෙක් මතවාද පැවතියත් 1704 එහි අයිතිය ආණ්ඩුකාර තුමා විසින් බෞද්ධයන්ට පවරා ඇත. ඕලන්දයන්ගේ ප්‍රධාන පරිපාලනය සහ ආගමික මධ්‍යස්ථානය වූ කොළඹට සමීපව පිහිටි කැළණිය මුල්කරගෙන ඇති වූ බෞද්ධ ප්‍රතික්‍රියාව ලන්දෙසීන්ගේ දැඩි අධීක්ෂණයට භාජනය විය.

ඕලන්ද බලය ඉතා ප්‍රබව පැවති ගාල්ල, කොළඹ හා හම්බන්තොට යන ප්‍රදේශවල ඔවුන්ගේ බලපෑම වඩාත් ප්‍රබල විය. නමුත් ක්‍රමයෙන් බෞද්ධ කටයුතු ප්‍රබලවත්ම ක්‍රිස්තියානි විරුද්ධව එළිපිට ක්‍රියාකිරීමට ජනතාව ඉදිරපත් වීමත් උඩරට රජතුමා නිරන්තරයෙන්ම පහතරට බෞද්ධයන්ගේ ආගමික වත් පිළිවෙත් නිදහසේ පවත්වාගෙන යාමට ඉඩදෙන ලෙසත් කළ ඉල්ලීම නිසා බෞද්ධ වත්පිළිවෙත් ලන්දේසී රජයේ කටයුතු වලට පහර නොවදින නිසා 1704 දී බෞද්ධ වත්පිළිවෙත්වලට අවහිර නොකළ යුතු බව රජය පිළිගනී. එය පහතරට බෞද්ධ ජනතාව ලැබු විශාල ජයග්‍රහණයකි. මෙහි සුවිශේෂී කාර්යභාරය ගණින්නාන්සේලා විසින් ඉටු කළ නිසා ගෞරවය ඔවුන් හට නිතරනිතරම හිමිවිය යුතුය.

පහතරට ඇති වු බෞද්ධාගමික ප්‍රබෝධය හඳුනාගැනීමේදී එය වඩාත් කාර්‍යක්‍ෂම වුයේ වේහැල්ලේ ධම්මදින්න හිමියන්ගේ ක්‍රියාකාරිත්වයත් සමඟය. ඒවාගේම සිටිනා මලුවේ ධම්මදින්න හිමියන් සමඟ එකතු වි කතරගම, තංගලු විහාරය, කැටකැටිය විහාර, කසාගල, තොවාය, ගලගම සහ කහදගල ආදී ප්‍රදේශවල ජීවත් වෙමින් සමකාලීන ගණින්නාන්සේලා මෙන් සිවුරු දරා ධර්ම ශාස්ත්‍රීය කටයුතුවල නිරත විය. ඊට සමාගාමීව මෙම අවධියේ සිටි සරණංකර හිමි ලෙව්කේරාල පල්ලේකුඹුරේ හිමි, කදිරගොඩ හිමි, හීනටිකුඹුරේ සුමංගල හිමි වැනි බෞද්ධ පුනර්ජීවනයට දිරිදුන් පිරිස් සමඟ එකතු වී ධර්ම ශාස්ත්‍රීය කටයුතුවල ප්‍රබෝධය ගැන පැහැදුණු කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා කුට්ටපිටිය, පැල්මඩුල්ල යන විහාර දෙකේ අඩුක්කුගම්මාන සහිතව පුදා සමන්තකුට විහාරයේ පැවති පොත් පත්වල දැනුම එක්රැස් කර ශාස්ත්‍රය නැවත බෙදා දීමට ක්‍රියාකරනු ලැබීය. ඒ තුළින් බෞද්ධාගමට එරෙහිව ක්‍රියා කළ ප්‍රෙඩිකාන්ට්වරු ඇතුළු පූජක පක්‍ෂය පෙරට වඩා දැඩි අපහසුතාවය පත් විය.

මෙම අවධිය වන විට විශේෂයෙන්ම බෞද්ධාගමික කටයුතු පහතරට ප්‍රදේශවල වඩාත් ප්‍රබල වන්නට විය. එයට හේතුව වූයේ ලන්දේසි ආර්ථික ප්‍රතිපත්තිය හමුවේ ධනවත් වූ මුලාදෑනීන්, ගුරුවරුන් හා වෙදමහත්වරුන්ගේ සහයෝගය නිසා බෞද්ධ කටයුතු වඩාත් ඉස්මතු වීමත් සමඟ ක්‍රිස්තියානි කටයුතු සහ ජන සංඛ්‍යාව පහළ බැස ඇත. 1718 වන විට කොළඹ ගාල්ල හා මාතර ප්‍රදේශයේ ක්‍රිස්තියානි බැතිමතුන් 43615 ක් වුවද බහුතරය වූයේ බෞද්ධයන්ය. මිෂනාරි පාසල්වලට පැමිණි ශිෂ්‍ය සංඛ්‍යාව ක්‍රමයෙන් අඩුවන්නට විය. එපමණක් නොව ප්‍රසිද්ධියේ උඩරටින් පහතරට ගිය භික්ෂූන් ගණින්නාන්සේලාට උපකාර කර ඇත. ඇතැම් විටක ඕලන්ද පළාත්වල ඉදි කෙරෙන ක්‍රිස්තියානි පල්ලිවලට විරුද්ධත්වය ප්‍රකාශ කළහ. 1742 හාපිටිගම කෝරළයේ පාසල් පල්ලියක් තැනීමට ස්වදේශීය මුලාදෑනින් එළිපිටම සහයෝගය භික්ෂූන් හට ලබාදීමට ඉදිරිපත් වූහ. 1738 හික්කඩුව අසළ අකුරටියේ සිල්වතා නමින් ලේඛනවල හැඳින්වෙන බෞද්ධාගම වැලඳගත් ඕලන්ද යටත් වැසියෙක් මුලාදෑනියාගේ ඉඩමක තාවකාලිකව ගොඩනැගූ මඩුවක් තුළ බණ කියද්දී ඕලන්ද නිළධාරීන් විසින් අල්ලාගත් බව වාර්තා වේ. මෙම අවධිය වනවිට පල්ලිවල ගුරුන්නාන්සේලා පවා රජයේ නියෝග නොසලකා හැර බෞද්ධයන්ට උපකාර කර ඇත. ඔවුන්ගේ කටයුතු පරීක්ෂාවට පැමිණි උසස් නිළධාරිහු බොහෝ විට ගැමියන්ගේ ගල් ගැසීම උසුළු විහුළු කිරීම හා සෝෂාවට ලක්විය. ඇතැම් විට ඔවුන්ට එරෙහිව කාය ශක්තිය ද භාවිතා කර තිබේ. මෙම ක්‍රියාවලිය පහතරට බෞද්ධාගමික ප්‍රබෝධයේ උපරිම අවස්ථාව ලෙස පෙන්වා දිය හැකිය.

මෙසේ බෞද්ධ බලය උද්දීපනය වෙද්දී මුල්කිරිගල විහාරය මුල්කරගෙන බෞද්ධාගමික කටයුතු ප්‍රබල ලෙස ව්‍යාප්ත විය. පෘතුගීසීන් විසින් විනාශ කළ ද මෙම අවධිය වන විට භික්ෂූන්ගේ මධ්‍යස්ථානයක් බවට පත්විය. මුල්කිරිගල ගණින්නාන්සේලාට වඩාත් ආරක්ෂිත ස්ථානයක් විය. මුල්කිරිගල අවට පරිවාර මධ්‍යස්ථා සම්පූර්ණයෙන්ම විනාශ වී නොගිය හෙයින් පුනුරුත්ථාපනය කිරීමට හැකි විය. ප්‍රදේශයේ ජනතාවට ශාස්ත්‍රිය දැනුම හා බෞද්ධ වත්පිළිවෙත් ආරක්ෂා කිරීම සඳහා නොමඳ අනුග්‍රහයක් මෙම විහාරය ආශ්‍රිතව දක්නට ලැබුණි.

මුල්කිරිගල සාපේක්ෂව දහඅටවන සියසේ සිව්වන දශකය වන විට බෞද්ධ බලය ස්මතු වන්නට විය. තොටගමුවේ පුරාණ විහාරයෙන් ඉස්මතු වූ බෞද්ධ ප්‍රබෝධය කච්චිවත්ත විහාරය වැලිගල අග්‍රබෝධි විහාරය, බෙන්තර ගලපාත විහාරය, අහංගම නවරත්න විහාරය හරහා

ඉස්මතු වන්නට විය. මෙසේ ගාලු ප්‍රදේශයේ ඉස්මතු වූ බෞද්ධ ප්‍රබෝධය මැඩලීමට 1740 ගණන්වල පාසල් පරීක්ෂ කටයුතුවල නිරත වූ ෆැබ්රෙසියස් පූජකතුමා හා සිකොලොව් පීටර් විසින් පරගහගොඩ හා අඳදොළ ගොඩනගා තිබූ විහාරාරාම සහ බොධි වෘක්ෂයන් විනාශකර දැඩි මර්දනකාරී ප්‍රතිපත්තියක් ගෙනගොස් ඇත. මෙසේ දීර්ඝ කාලයක් පුරා විදේශීය බලය හමුවේ විනාශයට පත්වන ශාසනික දේපළ ආරක්ෂාවීම සඳහා සාමූහිකව ක්‍රියා කළහ. විනාශ වී ගිය විහාරාරාම ආසන්නයේ තාවකාලිකව ඉදිකළ ගොඩනැගිලිවල බණ කීම් හා පරිත්‍රාණ දේශනා පවත්වා ඒවා රැකගැනීමට දිවිහිමියෙන් කටයුතු කළහ.

බෞද්ධ ප්‍රතික්‍රියාව රජයේ නිති රීති වලින් බැඳ දමා සීමා කිරීමට නොහැකි විය. ගාල්ල දිස්ත්‍රික්කයේ සිසුයෙන් රජයේ පාසල්වලට පැමිණි ශිෂ්‍ය සංඛ්‍යාව පහත වැටුනි. ඒ සමගම පයාගල, කහව සහ වැලිගම අලුතින් වෙහෙර විහාර ආරම්භ වන්නට විය. මීට පෙර මෙන් පාසල් පරීක්ෂාවට පැමිණි පූජකවරුන් හා නිළාධාරින් විසින් බෞද්ධ ආරාමවලට හිරිහැර කිරීමට උත්සාහ ගත්ත ද ජනතාවගෙන් ලැබුණු පිටුවහල නිසා එය එතරම් පහසු නොවිය. විශේෂයෙන්ම මෙම ප්‍රදේශයේ ජ්‍යෙෂ්ඨ මුලාදැනිවරු සෑම කෙනෙක්ම පාහේ හිතකාමින් වූ අතර සාහිත්‍ය කටයුතු නියුක්ත වුවන්ට අනුග්‍රහය දක්වා තිබේ. එය විශිෂ්ට ආගමික හා භාෂා ශාස්ත්‍රීය පුනර්ජීවනයට හේතු විය.

විශේෂයෙන්ම කීර්ති ශ්‍රී රාජසිංහ අවධියේ සරණංකර හිමියන්ගේ 'සිල්වත් සමාගම' පිහිටුවීමත් සමඟ උඩරට මෙන්ම පහතරට ප්‍රදේශවලින් ද බෞද්ධ ශාස්ත්‍රීය ගවේෂණයේ වර්ධනය වන්නය විය. උන්වහන්සේගෙන් ලද මාර්ගෝපදේශකත්වය නිසා පහතරට භික්ෂු කණ්ඩායම් ඉමහත් කැපවීමකින් හා ආත්ම පරිත්‍යාගයකින් තම පළාත්වල බෞද්ධාගමික කටයුතු ව්‍යාප්ත කොට බෞද්ධයන්ට නිදහසේ ආගම ඇදහීමේ ජන්ම අයිතිය දිනා ගැනීම සඳහා කැප වුයේය. උඩරට රජතුමාගෙන් ලද අනුග්‍රහය නිසාත් ඔහු සිංහල සංස්කෘතියේ ආරක්ෂකයා වීමත් නිසා උඩරට පහතරට භික්ෂු පරපුරේ එක්වීම සිදුවිය. පහත රටින් පැමිණි උඩරට රජුන්ට ධර්ම දේශනා කිරීම සහ ප්‍රබන්ධ රචනාකොට ඉදිරිපත් කිරීම නිසා රාජ්‍ය ගෞරවාදරයට පත්වී නොයෙක් වරදානයන්ට ලක් විය.

1753 මල්වතු විහාරය පැවැත්වූ උපසම්පදාවන් සමඟ උඩරට භික්ෂූන් වහන්සේලාට අමතරව පහතරට ධම්මජෝති, වෙහැල්ලේ ධම්මදින්න, වටරක්ගොඩ ධම්මපාල ආදී භික්ෂූන් පැමිණ උපසම්පදාව

ලබාගෙන ඇත. සංඝරාජ හිමි විසින් පුරුදු පුහුණු කරන ලද යතිවරු උපසම්පදාව හා ශික්ෂණය ඇතිව සිය ධර්ම ප්‍රචාරක හා ශාස්ත්‍රීය කටයුතු පහතරට ප්‍රදේශවල ද ව්‍යාප්ත කළහ. පහතරට ප්‍රදේශ ආශ්‍රිතව යටපත් වී තිබූ බුද්ධාගම පුනර්ජීවනය විය. මුල්කිරිගල, වෙහැල්ල වැනි පන්සල් මේ ව්‍යාපාරයට සම්බන්ධ විය. පහතරට ප්‍රදේශ වල කැපීපෙනෙන ශිෂ්‍ය පරම්පරාවක් බිහි කර පන්සල් ආරම්භ කර ශාසනික කටයුතු දියුණු කිරීමට සහාය දී ඇත. මෙසේ පහතරට ප්‍රදේශවල ඇති වූ පුර්ජීවනය නිසා ෆෝල්ත් හා පන්ඩර්ග්‍රුප් වැනි ඕලන්ද ආණ්ඩුකාරවරු විහාරාමලට ගොස් භික්ෂූන් වහන්සේලාට ත්‍යාග ප්‍රදානය කර සුහද සාකච්ඡා පවත්වා තිබේ. එයින් ගම්‍ය වන්නේ බෞද්ධාගමික පුනර්ජීවනය හමුවේ ලන්දදෙසින්ට සිය ආගමික ඒකාධිකාරය තවදුරටත් පවත්වාගෙන යාමට නොහැකි වූ බවයි.

දහ අටවන සියවසේ අවසාන කාලය වන විට පහතරට ප්‍රදේශයේ භික්ෂූන්ට නිදහසේ සිය ආගමික කටයුතු ඉටුකිරීමට හැකි විය. විශාල තරුණ පිරිසක් පන්සල් අධ්‍යාපනයට ඇතුළත් වී භික්ෂු සංවිධානයට ද සහය වූහ. උඩරට සමාජ ධූරාවලියේ රදළ පිරිස් පෙරමුණ ගත්ත ද පහතරට ප්‍රදේශවල කරාව, දුරාව, සලාගම හා නවන්දන්නා කුලවලට අයත් පිරිස් පෙරමුණ ගන්නා ලදි. මේ තත්ත්වය තුළ කුලවල තරුණ පිරිස් පහතරට භික්ෂු ශාසනයට ඇතුළත් වී බෞද්ධාගමික කටයුතුවල නිරතවීම නිසා පසු කාලයේ නිකාය වර්ධනය වීම සඳහා ද එයින් ඉවහල් විය. මුහුදුබඩ ප්‍රදේශවල ගණින්නාන්සේලා ජීවිත පරිත්‍යාගයෙන් කැපවීම නිසා හම්බන්තොට, මාතර, ගාල්ල දිස්ත්‍රික්ක හරහා කොළඹ දෙසට බෞද්ධ බලවේගය ව්‍යාප්ත විය. ඒවගේම 1796 ඉංග්‍රීසි ආගමනයත් සමඟ ලන්දේසි බලය බිඳ වැටීම තුළ බෞද්ධ ප්‍රබෝධය එතැන් සිට ඉංග්‍රීසින්ගේ ආගමික ප්‍රතිපත්තිය සමඟ ගැටෙන්නට විය.

මේ අනුව ඉහත තොරතුරු වලින් පැහැදිලි වන්නේ ප්‍රතිකාල් සහ ඕලන්ද බලය හමුවේ පහතරට ප්‍රදේශයේ බෞද්ධාගමික කටයුතු පසුගාමිත්වය කරා ක්‍රමයෙන් ගමන් කළ බවකි. එම පසුගාමීත්වය හමුවේ ශාසන විලෝපනය පැවති හිඩැස මගහරවා ගැනීමට ගණින්නාන්සේලා ඉටු කළ මෙහෙවර ඉතා ප්‍රසංසනීය. මේ පීඩනය වැඩි වත්ම පීඩනය මඟින් ජනිත කරවන ප්‍රතික්‍රියාවක් තුළින් පීඩනය ඉවතලන ආකාරය ඉතිහාසය පුරා නිරන්තරයෙන්ම දක්නට ඇත. එම සාවද්‍යය තුළින් පෙනි යන්නේ ශාසන විලෝපනය තුළ ගණින්වහන්සේලා දුෂ්කර මාවතක් ඔස්සේ පවත්වාගෙන ආ මෙහෙවර සරණංකර හිමියන්ගේ

පුරෝගාමීත්වයෙන් ඇරඹුණ පුනර්ජීවනය සමඟ දහ අටවන සියසේ අවසාන භාගය වනවිට බෞද්ධ ප්‍රබෝධය කාර්‍යක්‍ෂම වීමෙන් එය වඩා පැහැදිලි වේ. ලන්දේසීන් අවධියෙන් පසුව පහතරට මෙන්ම උඩරට ද බෞද්ධ බලය සමාජයේ තීරණාත්මක බලවේගය වන බවත් 1815 ගිවිසුමේ පස්වන වගන්තියෙන් හා 1818 ප්‍රකාශනයෙන් දෙන ලද පොරොන්දු වලින් වඩා පැහැදිලි වේ. එනමුත් බ්‍රිතාන්‍ය පාලනය යටතේ වුවද බෞද්ධයන්ට දැඩි පීඩනයක් එල්ල වන අතර ලන්දේසී හා ප්‍රතිකාල් අවධියට වඩා බෞද්ධ ප්‍රබෝධය මෙරට සමාජයේ තිරණාත්මක මෙහෙවරක් කිරීමට සමත් වූ බව ඉතිහාසය දෙස බැලීමෙන් පැහැදිලි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


01 හේමසිරි, හිමි. පී. රුහුණු සංඝ සංවිධානය,
මාතර බෝධි ආරක්‍ෂක සභාව,1990.

02 අර්සරත්නම්.එස්, ලංකාවේ ලන්දේසී බලය (1658-1697)
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

03 කිරිඇල්ලේ, ඤාණවිමල. වේහැල්ලේ ශ්‍රී ධම්මදින්න ශාසන ඉතිහාසය
කොළඹ, 1995.

04 එම්.යූ.සිල්වා, 17-18 සියවස්වල ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල
ගණින්නාන්සේලා සහ ඔවුන්ගෙන් බෞද්ධ ශාසනයට හා දේශීය
සංස්කෘතියට වූ සේවාව Rohana, No 5, 1994.

05 Goonawardhana K.W. Dutch Policy Towards Buddhisum in Sri Lanka and Some Aspects of its Impact C 1740 C 1740 Asian Panorama Essays in Asian History, Past and Presented by K.M. De Silva, Srima Kiribamune and C.R. De Silva Vikas Publishing house, 1990.

06. Mirando A.H. Buddhism in Sri Lanka in the Senteeth and Eighteenth Centeturies, Tisara Printers, 1985.

07. Kotawala D.A. The Dutch in Ceylon, London University, 1968.